විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. } විවැ/චක්‍රලේඛ/2013 දිනය / திகதி / Date } 2013- 02- 12

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/ 2013

සියළුම දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්
ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් වෙත,

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන් සඳහා හිඟ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම

2010- 07- 27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/ 2010 (I) න් සංශෝධිත 2010- 07- 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/ 2010 හි 02 ඡේදය යටතේ 2009- 05- 19 දිනට පෙර විශ්‍රාම ලැබූ සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සඳහා හිමිකම් නොමැත. එනම් ඔවුන්ට මාසික විශ්‍රාම වැටුප් සංශෝධනයට පමණක් හිමිකම ලැබේ. එම සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන් සඳහා විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදුවන වෙනත් අවස්ථාවන්හිදී (නැවත සේවයට බැඳී විශ්‍රාම යාම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/ 2010 සංශෝධන..... වැනි) සංශෝධිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීමට සිදු වේ.

02. එවැනි අවස්ථාවන්හිදී ඉහත චක්‍රලේඛ යටතේ හිමිකම් නොලැබූ පාරිතෝෂික මුදල ගෙවීම වැලැක්වීම පිණිස පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

6/ 2010, 6/ 2010 (I) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ මඟින් හිඟ පාරිතෝෂික නොගෙවුවද කල්පිත මත හිඟ පාරිතෝෂික ගණනය කර (අඩු නොකළ විශ්‍රාම වැටුප x 24) ගෙවූ ලෙස සලකා සංශෝධිත ප්‍රදානය අනුව හිමි පාරිතෝෂිකයෙන් අඩුකර සංශෝධිත හිඟ පාරිතෝෂිකය 2011- 08- 05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 (II) අනුව ගෙවීමට කටයුතු කළ යුතුය.

ඩී. ස්වර්ණපාල
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. විගණකාධිපති.

	Telephone	Fax		Telephone	Fax		Telephone
Director General	2431647	2342078	W&OP	2332346	2432214	Policy	2329580
Director	2432008	2342078	PSPF	2324375	2332347	Forces	2320439
Director (F)	2434974	2391403	L.G.U.	2342525	2342525	Computation	2434414
Internal Auditor	2329634	2329634	Registration	2329178	-	Payments	2431612

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk